# (ඇ) මිල හා වැටුප්

ජීවන වියදමෙහි ඇතිවන වෙනස් වීම් මැණීම සඳහා, වෙනත් දර්ශකයක් නොමැති නිසා කොළඹ කම්කරු පන්තියේ පවුලක අය වැය අනුව, සංඛ්‍යා හා ජන ලේඛන දෙපාර්තමේන්තුවෙන් සකස් කොට ඇති පාරිභෝගික මිල දර්ශකය ඒ සඳහා දැනට උපයෝගී කර ගනී. මේ දර්ශකයට ගැනෙන භාණ්ඩ ශීර්ෂ බර තබනු ලබන්නේ 1953 අංක VI දරන සැසි වාර්තාවේ නිර්දේශයන් අනුවය. පසුගිය තෙවස තුළ පාරිභෝගික මිල දර්ශකයේ ඇති වූ වෙනස් කම් භාණ්ඩ අනුව සහ ගණ අනුව වර්ග කොට පහත සටහනේ දක්වා ඇත.

### සංඛ්‍යා සටහන II ඇ—1

### කොළඹ පාරිභෝගික මිල දර්ශකය
### (පාදය 1952 = 100)

| වර්ෂය | සියලුම ශීර්ෂ | භාණ්ඩ අනුව | | | | | ගණ අනුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ආහාර (61·9%) | රෙදිපිළි (9·4%) | ඉන්ධන හා එළිය (4·3%) | ගෙවල් කුලී (5·7%) | විවිධ (18·7%) | දේශීය ගණය (51%) | ආනයන ගණය (44%) | අපනයන ගණය (5%) |
| 1960 | 103·5 | 100·8 | 95·1 | 102·7 | 101·5 | 117·5 | 108·9 | 93·7 | 138·4 |
| 1961 | 104·8 | 99·8 | 103·9 | 104·4 | 101·5 | 122·8 | 112·3 | 94·6 | 119·1 |
| 1962 | 106·3 | 100·9 | 108·2 | 105·6 | 101·5 | 124·9 | 113·9 | 96·7 | 113·8 |

සංඛ්‍යා— ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවෙන් සහ ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

වරහන් ඇතුළේ සංඛ්‍යා වලින් බර ප්‍රමාණයන් දක්වේ.

දර්ශකයේ මාසික වෙනස්වීම් පහත දක්වේ:—

### සංඛ්‍යා සටහන II ඇ—2

### පාරිභෝගික මිල දර්ශකයේ වෙනස්වීම්
### (පාදය 1952 = 100)

| මාසය | සියලුම ශීර්ෂ | | | ආනයන ගණය | | | දේශීය ගණය | | | අපනයන ගණය | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1961 | 1962 | %ට වෙනස | 1961 | 1962 | %ට වෙනස | 1961 | 1962 | %ට වෙනස | 1961 | 1962 | %ට වෙනස |
| ජනවාරි .. | 104·1 | 105·5 | +1·3 | 92·9 | 95·3 | +2·6 | 112·0 | 113·7 | +1·5 | 122·8 | 113·2 | −7·8 |
| පෙබරවාරි .. | 103·9 | 105·9 | +1·9 | 94·0 | 95·6 | +1·7 | 110·5 | 113·7 | +2·9 | 126·0 | 113·6 | −9·8 |
| මාර්තු .. | 103·3 | 106·2 | +2·8 | 92·0 | 97·5 | +6·0 | 111·3 | 113·0 | +1·5 | 123·2 | 114·7 | −6·9 |
| අප්‍රේල් .. | 103·9 | 106·3 | +2·3 | 93·6 | 97·1 | +3·7 | 111·0 | 113·5 | +2·3 | 123·4 | 113·8 | −7·8 |
| මැයි .. | 104·0 | 106·5 | +2·4 | 93·9 | 97·6 | +4·0 | 111·1 | 113·4 | +2·1 | 123·3 | 114·6 | −7·1 |
| ජූනි .. | 104·5 | 106·6 | +2·0 | 94·6 | 95·8 | +1·3 | 111·7 | 115·2 | +3·1 | 121·2 | 113·7 | −6·2 |
| ජූලි .. | 104·5 | 106·4 | +1·8 | 95·6 | 96·7 | +1·2 | 111·2 | 114·3 | +2·8 | 114·8 | 112·1 | −2·4 |
| අගෝස්තු .. | 105·4 | 106·2 | +0·8 | 96·5 | 97·6 | +1·1 | 112·3 | 113·2 | +0·8 | 113·2 | 111·3 | −1·7 |
| සැප්තැම්බර් .. | 105·4 | 106·2 | +0·8 | 95·8 | 97·1 | +1·4 | 112·9 | 113·3 | +0·4 | 114·7 | 112·0 | −2·4 |
| ඔක්තෝබර් .. | 105·9 | 106·5 | +0·6 | 95·6 | 96·4 | +0·8 | 113·8 | 114·5 | +0·6 | 116·8 | 113·6 | −2·7 |
| නොවැම්බර් .. | 105·9 | 107·2 | +1·2 | 95·3 | 96·6 | +1·4 | 114·2 | 115·7 | +1·3 | 115·8 | 114·7 | −0·9 |
| දෙසැම්බර් .. | 106·2 | 106·4 | +0·2 | 95·0 | 97·2 | +2·3 | 115·1 | 113·3 | −1·6 | 113·6 | 118·0 | +3·9 |
| සාමාන්‍යය .. | 104·8 | 106·3 | +1·4 | 94·6 | 96·7 | +2·2 | 112·3 | 113·9 | +1·4 | 119·1 | 113·8 | −4·5 |

සංඛ්‍යා— සංඛ්‍යා හා ජනලේඛන දෙපාර්තමේන්තුවෙන් සහ ශ්‍රී ලංකා මහ බැංකුවෙනි

කොළඹ පාරිභෝගික මිල දර්ශකය අනුව මනින කල, සිල්ලර මිල මට්ටමේ සාමාන්‍යය 1961 මට්ටමට වඩා 1962 දී සියයට 1·4 කින් වැඩි වී ඇත. මෙයට හේතු වූයේ දේශීය ගණ දර්ශකය සියයට 1·4 කින් හා ආනයන ගණ දර්ශකය සියයට 2·2 කින් වැඩිවීම නිසාත්, අපනයන ගණ දර්ශකය සියයට 4·5 කින් අඩු වීම නිසාත්ය. මුළු දර්ශකයට අපනයන ගණයේ ඇති වැද ගත්කම සියයට 5 ක් පමණි.

Price level

II ඇ—1 සංඛ්‍යා සටහනේ ඒකාබද්ධ භාණ්ඩ ගණ දර්ශකයන් පිරික්සන විට, හැම දර්ශක යක්ම 1961 දීට වඩා ඉහළ ගොස් ඇති බව හෙළිවේ. ආහාර ද්‍රව්‍ය සියයට 1·1 කින්ද, රෙදිපිළි සියයට 4·1 කින්ද, ඉන්ධන හා එළිය සියයට 1·1 කින්ද, විවිධ උපගණ දර්ශකය සියයට 1·7 කින්ද ඉහළ ගොස් ඇත.

ආහාර ද්‍රව්‍ය ශීර්ෂ වල උප ගණයන්හි මිල වෙනස් වූ හැටි, නිපදවන ස්ථාන අනුව වර්ග කොට පහත සටහනේ දක්වා ඇත :—

සංඛ්‍යා සටහන II ඇ—3

## පාරිභෝගික මිල දර්ශකයේ ආහාර උප ගණ පිළිබඳ මිල දර්ශක

**(පාදය 1952 = 100)**

| වර්ෂය | සියලුම ආහාර වර්ග | දේශීය ආහාර වර්ග | අපනයන ආහාර වර්ග | ආනයන ආහාර වර්ග |
|---|---|---|---|---|
| 1960 .. .. | 100·8 | 104·7 | 138·4 | 91·2 |
| 1961 .. .. | 99·8 | 110·6 | 119·1 | 87·2 |
| 1962 .. .. | 100·9 | 110·7 | 113·8 | 90·2 |

සංඛ්‍යා— ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවෙන් හා ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

1962 මෙරට ආහාර වර්ග සඳහා වූ මිල දර්ශකය ගිය වසරේදීට වඩා සියයට 0·1 කින් වැඩි වී ඇත. අනෙකුත් හේතූන් අතර, පැට්‍රෝල් බද්ද වැඩිවීම නිසා ආහාර වර්ග බෙද හැරීමේ ගමනා ගමන වියදම් වැඩි වූ බව මෙයින් පිළිබිඹු වේ. පිටරට පැටවෙන ආහාර ද්‍රව්‍ය උප ගණයෙහි මිල දර්ශකය සියයට 4·5 කින් පහළ වැටිණ. මෙයට බොහෝ දුරට හේතු වූයේ අපනයනය සඳහා පොල් නිෂ්පාදිත ඉල්ලීම අඩු වීමය. මෙය මෙරට පොල් මිල අඩු වීමෙන් පිළිබිඹු වේ. පිට රටින් ගෙන්වන ආහාර ගණයෙහි මිල සියයට 3·4 කින් වැඩි විය. මේ අනුව බිත්තර, කෝපි සහ අර්තාපල් ගෙන්වීම සීමා කිරීමත්, තීරු බදු වැඩි කිරීමත්, නිසා ඇතිවූ සම්පූර්ණ බලපෑම පිළිබිඹු වෙයි. 1961 ජූලි මාසයේදී පිටි වල මිල වැඩි කිරීමේ බලපෑම 1962 වසර පුරාම දැනෙන්නට විය. ආනයන ගණයෙහි මිල වැඩිවීමට තවත් හේතුවක් වූයේ 1962 ජනවාරියේ සිටම කළු සීනි නොමැති වීමය.

රෙදිපිළි ගණයේ මිල ඉහළ යාමට හේතු වූයේ 1961 ජූලි මාසයේ පනවන ලද තීරු බදු වැඩි කිරීමත්, ගෙන්වීම සීමා කිරීමත්ය. මේ සීමා කිරීම් 1962 වසර මුළුල්ලේම බල පැවැත්වූ අතර 1962 ජූලි මාසයේදී තීරු බදු තවත් වැඩි කරන ලදී.

ඉන්ධන හා එළිය ගණයෙහි මිල වැඩිවීමට තුඩු දුන් ප්‍රධාන සාධකය වූයේ, 1961 ජූලි මාසයේ දී භූමිතෙල් සඳහා තීරු ගාස්තුව වැඩි කිරීම සහ ගිනිපෙට්ටි වල දේශීය භාණ්ඩ බද්ද වැඩි කිරීමත්ය. මේ වැඩිවීම 1962 වසර මුළුල්ලේම බල පැවැත්විණි. විවිධ භාණ්ඩ ගණ වල මිල වැඩි වීමට තුඩු දුන් කරුණ වූයේ 1961 දුම්කොළ තීරු බද්ද වැඩිවීම නිසා, දුම්කොළ මිල ඉහළ යාමය. 1961 දී වැඩි කරන ලද මෙම බදු 1962 ජූලි මාසයේදී තව දුරටත් වැඩි කැරිණි.

එහෙත් කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙන් මැනිනු ලබන්නේ කම්කරු පන්තියට අයත් පුද්ගලයන්ගේ ජීවන වියදමෙහි ඇතිවන වෙනස් වීමය. කම්කරු පන්තියේ පවුලකට යන වියදමෙන් විශාල කොටසක් වැය වනුයේ ආහාර ද්‍රව්‍ය සඳහාය. පාද වර්ෂයේ මුල් පාරිභෝගික

වියදමෙන් සියයට 61·9 ක්ම වැය වූයේ ආහාර වර්ග වෙනුවෙනි. මේ ගණයේ සැහෙන ප්‍රමාණයක් එනම්, සියයට 14·9 ක්ම සමන්විත වන්නේ ආධාරයක් වශයෙන් නියමිත මිලෙන් කොටසක් රජයෙන් ගෙවා සපයන ආහාර වර්ග වලිනි. එසේම පරිප්පු, උම්බලකඩ, කරවල, ආදී පිට රටින් ගෙන්වන ද්‍රව්‍ය පාලන මිලකට සැපයේ. මෙසේ මේ ද්‍රව්‍ය වල මිල වෙනස් නොවන සේ ස්ථාවර කොට තිබීම නිසා, මේ දර්ශකය එතරම් වේගයෙන් ඉහළ නොගොස් නතර වී ඇත.

එහෙත් කම්කරු පන්තියෙන් වැඩි ඉල්ලීමක් නොවන සුඛෝපභෝගී සහ අර්ධ සුඛෝපභෝගී ගණයට වැටෙන භාණ්ඩ, කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ දක්වෙන අන්දමට වඩා ඉහළ ගියා විය හැකිය. 1962 ජුලි මාසයේදී ද අගෝස්තු මාසයේදී ද (1962 අංක. 19 දරන ආදයම් ආරක්ෂක පනත යටතේ) භාණ්ඩ වර්ග ගණනාවක ආනයන බදු වැඩි කැරිණි. වැඩි වූ ආනයන බදු වලින් සමහරක් සිල්ලර මිල වැඩි කිරීමේ මාර්ගයෙන් පාරිභෝගිකයාටම දැරීමට සිදුවිය. අනෙක් භාණ්ඩවල මිල, තවමත් එතරම් සැලකිය යුතු ලෙස වැඩිවී නොමැත. කලින් කී වර්ගයේ පාරිභෝගී භාණ්ඩ වලට කල් පවත්නා, ගේ දෙර බඩු මුට්ටු, ඇතුළත් වන අතර පසුව කී වර්ගයට සාමාන්‍ය රෙදිපිළි වර්ග බොහෝවක් ගැනේ. වැඩි වූ තීරු බදු, බඩු මිල කෙරෙහි එතරම් බල නොපෑමට හේතුවූයේ කලින් ගෙන්වා තුබූ බඩු තොග නිසා විය හැකිය. බදු පැනවීමට පෙරාතුව විශාල තොග ගෙන්වා නොතිබුන භාණ්ඩ සඳහා වැඩි වූ බදු, බොහෝ සෙයින්ම පාරිභෝගිකයා පිටම පැටවුණි.

### වැටුප්

1962 දී කම්කරුවන් වැඩි දෙනෙකුගේ වැටුප් ප්‍රමාණයන්හි වෙනසෙක් ඇති නොවිණි. වෙනස් වීමෙක් සටහන් වී ඇති, බොහෝ තැන් වල එසේ වූයේ ජීවන වියදම් දර්ශකය සමග වෙනස්වන දීමනා වැඩිවීම නිසාය. 1961 නොවැම්බර් මාසයේදී, ලංකා ව්‍යාපාර හිමියන්ගේ ඒකාබද්ධ සංගමය සහ ලංකා වෙළෙඳ සේවක සංගමය පැමිණි සම්මුතියකට අනුව, වෙළෙඳ ආයතන 59 ක ලිපිකරුවන් 6000 කට 1961 ජනවාරි පළමුවැනිද සිට දෙවසක පඩි වැඩිකිරීම් එක විට දෙන ලදී. මේ වැඩි කිරීම් 1962 සිට බලපාන්නට විය. 1962 ජුනි මාසයේදී කාර්මික අධිකරණයෙන් අලුත් වැටුප් ක්‍රමයක් දෙන ලදී. මෙය 1960* ඔක්තෝබර් මාසයේ සිට, බැංකු සේවකයනට දෙන ලද, දෙවසක හා, හත් වසක පඩි වැඩි කිරීමට සමාන වන අන්දමට සකස් කරන ලද්දකි.

වැටුප් ප්‍රමාණයන් වසරින් වසර වෙනස්වී ගිය අයුරු දක්වෙන දර්ශකයන් තිබෙන්නේ, රජයේ සේවකයන්, රජයේ පාසල් ගුරුවරුන් සහ පඩි පාලක සභා යටතට ගෙන ඇති සේවකයන් සම්බන්ධයෙන් පමණෙකි.

මහ ආණ්ඩුවේ සේවකයන් සහ රජයේ පාසල් ගුරුවරුන්ගේ වැටුප් හා මූර්ත වැටුප් පසු ගිය තුන්වසර තුළදී වෙනස් වී ගිය අන්දම පහත සටහනේ දක්වේ.

සංඛ්‍යා සටහන II ඈ—4

## රජයේ සේවකයන්ගේ වැටුප් ප්‍රමාණ දර්ශකය
## (1952 = 100)

| කාල ඡේදය | ලිපිකරු හා කාර්මික සේවකයෝ | | සුළු සේවකයෝ | | (අ) රජයේ සේවකයෝ | | රජයේ පාසැල් ගුරුවරු | |
|---|---|---|---|---|---|---|---|---|
| | වැටුප් ප්‍රමාණ දර්ශකය | මූර්ත වැටුප් ප්‍රමාණයන් | වැටුප් ප්‍රමාණ දර්ශකය | මූර්ත වැටුප් ප්‍රමාණයන් | වැටුප් ප්‍රමාණ දර්ශකය | මූර්ත වැටුප් ප්‍රමාණයන් | වැටුප් ප්‍රමාණ දර්ශකය | මූර්ත වැටුප් ප්‍රමාණයන් |
| 1960 | 122·3 | 118·2 | 130·4 | 126·0 | 126·7 | 122·4 | 117·4 | 113·4 |
| 1961 | 122·3 | 116·7 | 130·4 | 124·4 | 126·7 | 120·9 | 117·4 | 112·0 |
| 1962 | 122·3 | 115·0 | 130·4 | 122·6 | 126·7 | 119·2 | 117·4 | 110·4 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

(අ) ලිපිකරු හා කාර්මික සේවකයන් සහ සුළු සේවකයන්ගේ ඒකාබද්ධ දර්ශකය.

*1962 ජුනි 22 වැනි දින හා අංක 13179 දරන රජයේ ගැසට් පත්‍රයේ සහ 1963 මාර්තු 1 වැනි දින හා අංක 13539 දරන රජයේ ගැසට් පත්‍රයේ කාර්මික ආරාවුල් අංක 306 සහ 306 ආ.

1962 දී මේ සේවකයන්ගේ වැටුප් ප්‍රමාණයන්හි වෙනසෙක් ඇති වී නොමැත. එහෙත් 1962 දී ජීවන වියදම වැඩි වූ නිසා ඔවුන්ගේ මූර්ත වැටුප් සියයට 1·4 කින් පහළ වැටිණි.

පෞද්ගලික අංශයේ වැටුප් ප්‍රමාණයන්හි ඇතිවූ වෙනස්වීම් පිළිබඳ සංඛ්‍යා තොරතුරු ඇත්තේ පඩි පාලක සභා යටතට ගෙන ඇති කර්මාන්තවල නියුතු කම්කරු වැටුප් සම්බන්ධයෙන් පමණෙකි. පඩි පාලක සභා යටතට ගෙන ඇති කම්කරුවන්ගෙන් සියයට 89·4 ක්ම කෘෂිකර්මාන්තයේ නියුතු වූවෝ වෙති. පඩි පාලක සභා යටතට ගෙන ඇති වෘත්තීන්හි නියුතු කම්කරුවන්ගේ වැටුප් ප්‍රමාණයන් හා මූර්ත වැටුප් ප්‍රමාණයන් පසුගිය තෙවස තුළදී වෙනස් වී ගිය අන්දම පහත සංඛ්‍යා සටහනේ දැක්වේ.

සංඛ්‍යා සටහන II ඇ—5

## පඩි පාලක සභා යටතට ගැනෙන කර්මාන්තයන්හි නියුතු කම්කරුවන්ගේ අවම වැටුප් ප්‍රමාණ දර්ශක අංක (1952 = 100)

| කාලච්ඡේදය | කෘෂිකර්මාන්තයෙහි නියුතු කම්කරුවන් | | කාර්මික හා වාණිජ සේවාවන්හි නියුතු කම්කරුවන් | | පඩි පාලක සභා යටතට ගැනෙන කර්මාන්තයන්හි නියුතු කම්කරුවන් (අ) | |
|---|---|---|---|---|---|---|
| | අවම වැටුප් ප්‍රමාණ දර්ශකය | මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශකය | අවම වැටුප් ප්‍රමාණ දර්ශකය | මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශකය | අවම වැටුප් ප්‍රමාණ දර්ශකය | මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශකය |
| 1960 | 110·2 | 106·5 | 128·1 | 123·8 | 111·8 | 108·0 |
| 1961 | 110·7 | 105·6 | 128·4 | 122·5 | 112·3 | 107·2 |
| 1962 | 111·9 | 105·2 | 129·5 | 121·8 | 113·7 | 106·9 |

සංඛ්‍යා—ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවෙන් සහ ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

(අ) කෘෂිකර්මාන්තයෙහි, කර්මාන්තයෙහි හා වෙළෙඳාමෙහි නියුතු කම්කරුවන්ගේ ඒකාබද්ධ දර්ශකය.

පඩි පාලක සභා යටතට ගනු ලැබූ වෘත්තීන් හි නියුතු කම්කරුවන්ගේ වැටුප් ප්‍රමාණයන් 1962 සියයට 1·1 කින් වැඩිවිය. මෙයට හේතු වූයේ කෘෂිකර්මාන්තයේ නියුතු කම්කරුවන්ගේ වැටුප් සියයට 1·1 කින් ද, කර්මාන්තවල හා වෙළෙඳාමෙහි නියුතු කම්කරුවන්ගේ වැටුප් සියයට 0·9 කින් ද වැඩිවීමය. එහෙත් ඔවුන්ගේ මූර්ත වැටුප් ප්‍රමාණයන් පිළිවෙළින් සියයට 0·4 කින් හා සියයට 0·6 කින් අඩුවිය.